# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2299/63 – 2022 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා – 2022.09.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/45.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්,

පී. පී. පීරිස් මයා, අංක 62, බලපොකුණ පාර, කිරුළපන, කොළඹ 06.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත


1A – G 37672 – 09(2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කළල්ගොඩ පාර, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, අංක 15, කැප්ටන් එම්. ජී. පී. මෙන්ඩිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/45.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්,

පී. පී. පීරිස් මයා, අංක 62, බලපොකුණ පාර, කිරුලපන, කොළඹ 06.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ පී. පී. පීරිස් මහතා වෙත විශ්‍රාම යාමට පෙර හිමිවන තෛමාසික නිවාඩුව ලබා නොගෙන සේවය කිරීම මත ඒ සඳහා වන මාස 03ක වැටුපට සමාන දීමනාව හිමි ද, හිමිනම් එය ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදු වී තිබේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 - 0362/1

---

මගේ අංකය: IR/COM/01/2021/09.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. ජී. කේ. සේනාරත්න මයා, 442/18, මැදගේට්ටුව පාර, රත්මල්ගොඩ, පෝරුවදණ්ඩ, හොරණ.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බටුවත්ත, නාරංගොඩ පාළුව, අංක 501, නීතීඥ පාලිත සේනාධීර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/09 .

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්,

කේ. ජී. කේ. සේනාරත්න මයා, 442/18, මැදගේට්ටුව පාර, රත්මල්ගොඩ, පෝරුවදණ්ඩ, හොරණ.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

''කේ. ජී. කේ. සේනාරත්න මහතාට විරුද්ධව පැවති විනය පරීක්ෂණයෙන් අනතුරුව වසරක සේවා කාලයක් අහිමි කිරීම එම සේවා කාලය සඳහා වැටුප් සහ සියලු දීමනා අහිමි කිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද ? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 09 - 0362/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.